## පුස්තකාලය

## කැලණිය විශ්වවිද්‍යාලය

### පුස්තකාල ප්‍රකාශන සහ ප්‍රවේශාංක අපසාරණය පිළිබඳ ප්‍රතිපත්තිය

**1. අර්ථ නිරූපණය:**

ප්‍රවේශ ලේඛනයෙහි ඇතුළත් කොට ඇති කිසියම් ප්‍රකාශනයක් හෝ ප්‍රවේශාංකයක්,

(අ) ඉන් ඉවත් කිරීම හෙවත් අවලංගු කිරීම පිළිබඳ සියලු කටයුතු අපසාරණය යන්නෙන් අදහස් වේ.

(ආ) ප්‍රකාශනයක් අපසාරණය කිරීම යන්නෙන් අදහස් කෙරෙනුයේ, ප්‍රවේශගත කරන ලද ප්‍රකාශනයක් පුස්තකාල සම්භාරයෙන් ඉවත් කිරීම වේ.

(ඇ) ප්‍රවේශාංකයක් අපසාරණය කිරීම යන්නෙන් අදහස් කෙරෙනුයේ, අදාළ ප්‍රකාශනය පුස්තකාල සම්භාරයෙන් ඉවත් නොකරමින් ප්‍රවේශ අංකය පමණක් ප්‍රවේශ ලේඛනය තුළ අවලංගු කිරීමයි.

**2. අපසාරණයට භාජනය වන පුස්තකාල ද්‍රව්‍ය:**

කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලයට ප්‍රතිග්‍රහණය කර ප්‍රවේශ ලේඛනයට (Accession Register) ඇතුළත් කර ඇති අපසාරණයට භාජනය වන පුස්තකාල තොරතුරු මූලාශ්‍ර පහත පරිදි වර්ග කර දැක්විය හැකිය.

- ප්‍රවේශගත කර ඇති ග්‍රන්ථ
- ප්‍රවේශගත කර ඇති වාර සඟරා
- ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ලෙස ප්‍රවේශ ලේඛනයෙහි ඇතුළත් CD, DVD, Diskette, Cassettes ආදිය වේ.

**3. ප්‍රවේශාංක, ප්‍රකාශන සහ ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය අපසාරණයට තුඩු දෙන හේතු:**

**ප්‍රකාශන සහ ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය**

(අ) පාඨකයෙකු විසින් නැති කරන ලද හෝ ආපසු භාර නොදෙන ලද ප්‍රවේශ ගත කර ඇති කිසියම් ප්‍රකාශනයක් වෙනුවෙන් ඔහු විසින් එහි නියමිත වටිනාකම ගෙවූ විට එම ප්‍රකාශනය අපසාරණය කළ හැකිය.

(ආ) පිටු අඩුවීම, ඉරීයාම, දිරාපත් වීම, අබලන් වීම, කෘමි සතුන් විසින් හානි කර තිබීම සහ වෙනත් ස්වාභාවික හේතු මත විනාශ වීම ආදී හේතු නිසා ප්‍රවේශ ලේඛනගත කිසියම් ප්‍රකාශනයක් තව දුරටත් ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත් වූ විට එම ප්‍රකාශනය අපසාරණය කළ හැකිය.

(ඇ) CD, DVD, Diskette, Cassettes ආදී ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය සීරීම්වලට ලක් වීම, කාලයක් ගත වීමත් සමඟ අක්‍රීය තත්ත්වයට පැමිණීම, ඒවා ක්‍රියාත්මක කරවීමට අවශ්‍ය උපකාරක මාධ්‍ය භාවිතයෙහි නොමැති වීම, පාඨක රුචිකත්වය හීන වීම ආදී හේතු නිසා එකී ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය අපසාරණය කළ හැකිය.

(ඈ) ප්‍රවේශ ලේඛනගත කිසියම් ප්‍රකාශනයක අන්තර්ගතව ඇති කරුණු පුස්තකාල පාඨක අවශ්‍යතාවලට නොසරිලන අයුරින් යල් පැන ගොස් ඇතැයි තීරණය කළ විට එම ප්‍රකාශනය අපසාරණය කළ හැකිය.

(ඉ) සොරකම් කිරීම ආදී විවිධ හේතු මත ප්‍රවේශ ලේඛනගත කිසියම් ප්‍රකාශනයක් අස්ථානගත වූ විට එම ප්‍රකාශනය අපසාරණය කළ හැකිය.

(ඊ) ගින්නට හසු වීම්, ජලයට හසු වීම් සහ වෙනත් අනපේක්ෂිත වූ ස්වාභාවික ආපදා නිසා ප්‍රවේශ ලේඛනගත ප්‍රකාශන විනාශයට පත් වූ විට එම ප්‍රකාශන අපසාරණය කළ හැකිය.

(උ) එකම ග්‍රන්ථ නාමයකට අදාළව පිටපත් ගණනාවක් ඇති විට පසුගිය වසර දහයක කාලය තුළ එම පිටපත් පාඨකයා විසින් භාවිත කර ඇති ආකාරය සංඛ්‍යාත්මකව අවම වාර ගණනක රඳා පවතී නම් එවැනි පිටපත් අපසාරණය කළ හැකිය.

<u>ප්‍රවේශාංක</u>

(අ) ප්‍රවේශ ලේඛනගත කොට ඇති කිසියම් ප්‍රකාශනයක් (පොතක් ගණයෙහි ලා සැලකිය නොහැකි) පුස්තිකාවක් වශයෙන් සැලකිය යුතු යැයි තීරණය කළ විට ප්‍රවේශ ලේඛනයෙහි ඊට අදාළ ප්‍රවේශාංකය අවලංගු කළ හැකිය.

(ආ) ප්‍රවේශ ලේඛනගත කර ඇති කිසියම් ප්‍රකාශනයක් තවත් ප්‍රවේශ අංකයක් සහිත ප්‍රකාශනයක් සමඟ එකට බැඳිය යුතු යැයි තීරණය කළ විට ප්‍රවේශ ලේඛනයෙහි ඊට අදාළ ප්‍රවේශාංකය අවලංගු කළ හැකිය.

(ඇ) ප්‍රවේශ ලේඛනගත කර ඇති කිසියම් ප්‍රකාශනයක් තවත් ප්‍රවේශ අංකයක් සහිත ප්‍රකාශනයක් සමඟ එකට බැඳ ඇති විට ප්‍රවේශ ලේඛනයෙහි ඊට අදාළ ප්‍රවේශාංකය අවලංගු කළ හැකිය.

## 4. <u>පොත් අපසාරණ ක්‍රියාවලියට අදාළව අනුගමනය කළ යුතු පියවර</u>

කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලයේ ප්‍රකාශන අපසාරණ ක්‍රියාවලිය සඳහා බඳුන් වනුයේ පුස්තකාල ප්‍රවේශ ලේඛනයට ඇතුළත් කර ඇති ප්‍රකාශන පමණක් බව සැලකිය යුතුය.

(අ) පුස්තකාලයේ සංරක්ෂණය කළ නොහැකි හා භාවිත කළ නොහැකි පොත් පුස්තකාලයේ ඒ ඒ අංශ මඟින් යොමු කරන අවස්ථාවල දී අදාළ ලැයිස්තු සමඟ පරීක්ෂා කර බාර ගැනීම.

(ආ) එම පොත් ඒ ඒ පීඨ සහ අධ්‍යයන අංශ අනුව ප්‍රවේශ අංක අනුපිළිවෙළට ලැයිස්තු ගත කිරීම.

(ඇ) ඊට අදාළ නිර්දේශ ලබා ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ ආචාර්ය භවතුන් නම් කර එවන මෙන් පීඨාධිපතිවරුන් වෙත දැන්වීම.

(ඈ) නම්කරනු ලබන ජ්‍යෙෂ්ඨ ආචාර්යභවතුන් වෙත අදාළ පොත් පරීක්ෂාවට ලබා දී ඔවුන්ගේ නිර්දේශ ලබා ගැනීම. එම නිර්දේශ පහත පරිදි විය හැකිය.

- සංරක්ෂණය කර නැවත භාවිතයට ගැනීමට කටයුතු කිරීම.
- පුස්තකාල භාවිතයෙන් ඉවත් කර අධ්‍යයන අංශ වෙත හෝ අවසරය පරිදි වෙනත් අධ්‍යාපනික ආයතන වෙත ලබා හෝ පුස්තකාල වෙත ලබා දීමට කටයුතු කිරීම.
- අපසාරණය කිරීමට කටයුතු කිරීම.

(ඉ) උක්ත ලබා ගත් නිර්දේශ කිරීම අනුව පොත් නැවත ලැයිස්තුගත කිරීම සහ පුස්තකාල කමිටු නිර්දේශ සඳහා ඉදිරිපත් කිරීම.

(ඊ) පුස්තකාල කමිටු නිර්දේශ සනාථන සභාවට ද එහි අනුමැතියෙන් අනතුරුව පාලක සභාවට ද ඉදිරිපත් කිරීම.

(උ) පාලක සභාවේ තීරණය අනුව අපසරණ කටයුතු සම්පූර්ණ කිරීම.

(ඌ) පාලක සභාවේ අනුමැතියෙන් පසු ප්‍රවේශ ලේඛනයේ අදාළ සංශෝධන කිරීම සහ පුස්තකාලයාධිකාරිගේ හෝ ඔහුගේ බලය ලත් නිලධාරීන්ගේ අත්සන යෙදීම.

(එ) අදාළ පොත් සඳහා වන සූචි වාර්තා ඉවත් කිරීම හෝ සංශෝධනය කිරීම.

**5. පුස්තකාල සම්භාර අපසාරණයට අදාළ තීරණ ගැනීමේ අයිතිය:**

උක්ත අංක 02 හි දක්වා ඇති හේතූන්වලට යටත්ව පුස්තකාලයේ ප්‍රවේශ ගත කර ඇති ඕනෑම ප්‍රකාශනයක් අපසාරණය කිරීම පිළිබඳ අවසාන තීරණය ගත යුත්තේ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසිනි.

**6. අපසාරණ වාර්තා සම්පාදනය සහ පවත්වාගෙන යාමට අදාළ විධිවිධාන:**

(අ) සෑම අපසාරණ කාර්යයකදීම අපසාරණ වාර්තාවක් සම්පාදනය කළ යුතුය.

(ආ) සම්පාදිත අපසාරණ වාර්තා අපසාරණ ප්‍රතිග්‍රහණ අංශය භාර සහකාර/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරයා විසින් අපසාරණ අංක අනුක්‍රමය අනුව ගොනුකොට නඩත්තු කළ යුතුය.

(ඇ) අපසාරණය කරන ලද පොත්වල විස්තර ඇතුළත් අපසාරණ ලේඛනයක් නඩත්තු කළ යුතුය. අදාළ ලේඛනයේ පහත දැක්වෙන තොරතුරු සටහන් කළ යුතුය.

- අපසාරණය කරනු ලබන දිනය (Weeding Date)
- අපසාරණ අංකය (Weeding Number)
- ප්‍රවේශ අංකය (Accession Number)
- ග්‍රන්ථ නාමය (Title)
- ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ථ අංකය (ISBN)
- කර්තෘ/සංස්කාරක/පරිවර්තක/සම්පාදක (Author/Editor/Translator/Compiler)
- ප්‍රකාශක/ප්‍රකාශිත ස්ථානය සහ ප්‍රකාශිත වර්ෂය (Publisher/Publication Place & Published Year)
- මිල
- අපසාරණයට හේතු
- අයකරගත් වටිනාකමක් ඇත්නම් එය
- පුස්තකාලයේ වත්කමෙන් අඩු කළ යුතු මුදල

<u>සැ. යු.</u>

➢ **<u>ප්‍රවේශාංකයක්</u>** අපසාරණය කිරීමක් සිදු කරන විට **අයකරගත් වටිනාකම සහ පුස්තකාලයේ වත්කමෙන් අඩු කළ යුතු මුදල** යන කාරණා දෙක සම්පූර්ණ කළ යුතු නොවේ.

➢ මුදල් ගෙවා ප්‍රතිග්‍රහණය කරන ලද යම් **<u>ප්‍රකාශනයක්</u>** අපසාරණය කිරීමේ දී, **පුස්තකාලයේ වත්කමෙන් අඩු කළ යුතු මුදල** යන කාරණාව සම්පූර්ණ කළ යුත්තේ අපසරණ වාර්තාවෙහි ඇති අංක 03 යටතේ දැක්වෙන **(ආ) දැන් වටිනාකම සහ අය විය යුතු මුදල** යන වගන්තියට අදාළව දැක්වෙන මුදලය.

➢ අපසාරණය කරන ලද **<u>ප්‍රකාශනයක්</u>** සඳහා වටිනාකම අයකරගෙන නොමැති නම් එම අවස්ථාවේ දී ද **පුස්තකාලයේ වත්කමෙන් අඩු කළ යුතු මුදල** යන කාරණාව සම්පූර්ණ කළ යුත්තේ අපසාරණ වාර්තාවෙහි ඇති **(ආ) දැන් වටිනාකම සහ අය විය යුතු මුදල** යන වගන්තියට අදාළව දැක්වෙන මුදලය.

(ඈ) පාඨකයා විසින් නැති කරන ලද ප්‍රකාශනයක් සඳහා වන අයකිරීම්හි දී මිල තීරණය කළ යුත්තේ, එම ප්‍රකාශනයෙහි වර්තමාන වටිනාකමට අනුවය. පුස්තකාලය විසින් අනුගමනය කරනු ලබන එකඳු හෝ නිර්ණායකයකට ගැළපෙන පරිදි එම ප්‍රකාශනයෙහි වර්තමාන වටිනාකම නිර්ණය කිරීමට හැකියාවක් නොමැති නම් උපකුලපතිතුමා විසින් නම් කරනු ලබන අදාළ විෂය පිළිබඳ ප්‍රවීණයෙකු විසින් නිර්දේශ කරන මිලකට යටත්ව අය කිරීම සිදු කළ යුතුය.

(ඉ) නැති වූ පොතකට පාඨකයා විසින් මුදල් ගෙවීමක් සිදු කරන්නේ නම් මුදල් ගෙවන ලද රිසිට්පත් අදාළ අපසාරණ වාර්තාව සමග **අංශභාර සහකාර හෝ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරීගේ** පරීක්ෂාව සහ ප්‍රතිග්‍රහණ ලේඛනයේ ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

(ඊ) අදාළ අපසාරණ අංකය රතු වර්ණය සහිත තීන්ත පෑනකින් සඳහන් කළ යුතුය.

(උ) පිටපත් කිහිපයක් ඇති ප්‍රකාශනයක එක් පිටපතක් අපසාරණය කළ කල්හි අදාළ ප්‍රකාශනයෙහි එම ප්‍රවේශ අංකය පමණක් කපා හැරිය යුතු අතර එම ස්ථානයේ අපසාරණ අංකය රතු පාටින් සටහන් කොට ප්‍රවේශ ලේඛන කටයුතු සිදු කරනු ලබන පුස්තකාල තොරතුරු සහකාරගේ අත්සන තැබිය යුතුය.

(ඌ) අපසාරණය කරන ලද ප්‍රකාශන සියල්ලේම **"අපසාරණය කරන ලදි"** යන මුද්‍රාව සහ අපසාරණ අංකය සටහන් කළ යුතුය. මුද්‍රා තැබීම සහ අංකය යෙදීමට ග්‍රන්ථ නාම පිටුව භාවිත කළ යුතු අතර ග්‍රන්ථ නාම පිටුව නොමැති නම් පමණක් වෙනත් පිටුවක් භාවිත කළ හැකිය.

(එ) අපසාරණය කරන ලද ප්‍රකාශනයට අදාළ ප්‍රවේශ අංකය සහ ග්‍රන්ථ විස්තර රතු පෑනකින් ලේඛනයෙන් කපා දමා අදාළ ස්ථානයේ අපසාරණ අංකය සහ අපසාරිත දිනය සටහන් කොට ප්‍රවේශ ලේඛන කටයුතු සිදු කරනු ලබන පුස්තකාල තොරතුරු සහකාරගේ අත්සන තැබිය යුතුය.

**7. පරිත්‍යාග වශයෙන් ලැබෙන ප්‍රකාශන ප්‍රතිග්‍රහණය සහ අපසාරණය පිළිබඳ අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය.**

පරිත්‍යාග වශයෙන් ලැබෙන ග්‍රන්ථ, වාරසඟරා සහ ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය යන තොරතුරු මූලාශ්‍ර කැලණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයට ප්‍රතිග්‍රහණය කර ගැනීමේ දී ප්‍රතිග්‍රහණ අංශයෙහි අංශ ප්‍රධාන සහකාර/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී විසින් පහත සඳහන් කරුණු සලකා බලා අදාළ ප්‍රකාශන ප්‍රතිග්‍රහණය කර ගැනීමට කටයුතු කළ යුතුය.

(අ) පරිත්‍යාග වශයෙන් ලැබෙන ප්‍රකාශන ප්‍රතිග්‍රහණය කර ගැනීමේ දී ඒවාගේ ගුණාත්මක භාවය සලකා බැලිය යුතුය. පිටු අඩුවීම, වර්ණ සහිත පෑන්-පැන්සල් ආදියෙන් පිටු මත ඉරි ඇඳීම සහ අකුරු පාට කර තිබීම, ඉරීයාම, දිරාපත් වීම, අබලන් වීම, කෘමි සතුන් විසින් හානි කර තිබීම සහ වෙනත් ස්වාභාවික හේතු මත විනාශ වීම ආදී හේතු නිසා ගුණාත්මක භාවය අතින් භෞතික තත්ත්වයට හානි වී ඇති පරිත්‍යාග වශයෙන් ලැබෙන ප්‍රකාශන ප්‍රතිග්‍රහණය කර ගැනීමෙන් වැළකී සිටිය යුතුය.

(ආ) විශ්වවිද්‍යාලයේ පාඨමාලා සහ විෂය නිර්දේශ අවශ්‍යතාවලට නොගැළපෙන, උපයෝජක අවශ්‍යතා සහ රුචිකත්වයට පටහැනි, පුස්තකාලයේ සමබර එකතුවක් පවත්වාගෙන යාමට අවශ්‍ය අවකාශය සීමා වන එකතුන් සහිත පරිත්‍යාග පුස්තකාලය වෙත ප්‍රතිග්‍රහණය කර ගැනීමෙන් වැළකී සිටිය යුතුය.

(ඇ) උක්ත හේතුන් නිසා පරිත්‍යාග වශයෙන් ලැබෙන ප්‍රකාශන පුස්තකාල එකතුවට ඇතුළත් කිරීමට තීරණය නොකර වෙනත් එකතුවක් ලෙස නඩත්තු කිරීමේ තීරණය මත ප්‍රතිග්‍රහණය කරන්නේ නම් එම ප්‍රකාශනවලට ප්‍රවේශාංක ලබා දීම හෝ ඒවා ප්‍රවේශගත කිරීම සිදු නොකළ යුතුය.

(ඈ) අදාළ පරිත්‍යාගය ලබා ගැනීමේ දී උක්ත කරුණු සලකා බලා තේරීමකට යටත්ව පුස්තකාලයට අවශ්‍ය ප්‍රකාශන පමණක් ප්‍රතිග්‍රහණය කර ගැනීම සිදු කළ යුතුය. එසේ තේරීමකින් පසුව අනවශ්‍ය යැයි සලකා ඉවත් කෙරෙන ප්‍රකාශන නැවත පරිත්‍යාගශීලියා වෙත භාර ගැනීමට ඔහු/ඇය විසින් කැමැත්තක් නොදක්වන්නේ නම් ඔහුගේ/ඇයගේ අනුදැනුම ඇතිව එකී මූලාශ්‍ර වෙනත් පුස්තකාලයකට හෝ පරිබාහිර පාඨකයන් වෙත නොමිලේ ලබා දීමට කටයුතු සැලැස්විය යුතුය. එහිදී වෙනත් පාඨකයන් සහ ආයතන විසින් ද අදාළ පරිත්‍යාගය බාර ගැනීම ප්‍රතික්ෂේප කරයි නම් එවැනි අවස්ථාවල එම ප්‍රකාශන විනාශ කිරීමට අවසර ලැබේ.

(ඉ) පරිත්‍යාග වශයෙන් ලැබෙන ප්‍රකාශන ප්‍රතිග්‍රහණය කර ප්‍රවේශගත කිරීමට තීරණය කරන්නේ නම් අපසාරණ කාර්යයන් හි පහසුව සහ අවශ්‍යතාව සලකා ඒවාගේ මිල දැක්වීම පහත නිර්ණායකවලට යටත්ව සිදු කළ යුතුය.

- ✓ අදාළ ප්‍රකාශනයෙහි මිලක් දක්වා ඇති නම් එම මිලම ප්‍රවේශ ලේඛනයේ සඳහන් කළ යුතුය.
- ✓ මිලක් දක්වා නැති ප්‍රකාශන සඳහා අන්තර්ජාලය (amazon.com ආදී) භාවිතයෙන් අදාළ ප්‍රකාශනයට මිල සොයා ගත හැකි නම් එම මිල ප්‍රවේශ ලේඛනයේ සඳහන් කළ යුතුය.
- ✓ උක්ත කාරණා දෙකම සිදු කළ නොහැකි විට පුස්තකාලයෙහි ඇති මිල ගණන් තීරණය කිරීමට සකසා ඇති නිර්ණායකවලට අනුව මිල දැක්වීම සිදු කළ යුතුය.

- ✓ එනමුත්, පුස්තකාල නිර්ණායකවලට අනුව දක්වන මිල අදාළ ප්‍රකාශන සඳහා නොසෑහෙන්නේ නම් හෝ කුමන හෝ විශේෂිත කරුණක් නිසා ගණනය කරනු ලබන වටිනාකමට වඩා වැඩි යැයි හැඟෙන්නේ නම් උපකුලපතිතුමා විසින් නම් කරනු ලබන අදාළ විෂය ප්‍රවීණයෙකුගේ නිර්දේශය මත එම ප්‍රකාශන සඳහා මිල නියම කළ යුතුය.

උක්ත නිර්ණායකවලට අනුව පරිත්‍යාග වශයෙන් ලබා ගෙන ප්‍රවේශගත කර ඇති ප්‍රකාශන අපසාරණය කරන අවස්ථාවේ දී අපසාරණ ආකෘති පත්‍රයෙ හි අංක 03 හි (අ) **යටතේ දැක්වෙන ප්‍රකාශන ප්‍රතිග්‍රහණ අවස්ථාවේ එහි වටිනාකම** යන වගන්ති ප්‍රකාරව මිල දැක්විය යුතුය.

**<u>සැ. යු.</u>**

පරිත්‍යාග වශයෙන් ලද ප්‍රවේශ ලේඛනයට ඇතුළත් කර ඇති උක්ත සඳහන් ප්‍රකාශන සහ ප්‍රවේශාංක අපසාරණය කිරීමක දී **"පුස්තකාල ප්‍රකාශන සහ ප්‍රවේශාංක අපසාරණය පිළිබඳ ප්‍රතිපත්තියෙහි"** විස්තර වන ක්‍රියාවලිය ම අනුගමනය කිරීම මැනවි.

පුස්තකාලය-කැලණිය විශ්වවිද්‍යාලය ආකෘති පත්‍ර අංකඃ

## ප්‍රකාශන සහ ප්‍රවේශාංක අපසාරණ වාර්තාව

අපසරණ අංකයඃ

### 1. ප්‍රකාශනය පිළිබඳ විස්තර

ප්‍රවේශ අංකයඃ

කර්තෘ/සංස්කාරක/පරිවර්තකඃ

ග්‍රන්ථ නාමයඃ

සංස්කරණයඃ

ජාත්‍යන්තර ප්‍රමිත ග්‍රන්ත අංකය (ISBN)ඃ

ප්‍රකාශක/ප්‍රකාශිත ස්ථානය සහ දිනයඃ

මුද්‍රණය පිළිබඳ විස්තරඃ

මිලඃ

### 2. ප්‍රකාශනය මිලදී ගැනීමකි/පරිත්‍යාගයකි

### 3. අපසාරණයට හේතුවඃ

### 4. වටිනාකම තක්සේරු කිරීමඃ

| (අ) ප්‍රකාශනය ප්‍රතිග්‍රහණය කරන අවස්ථාවේ එහි වටිනාකම | රු. | ශත |
|---|---|---|
| ප්‍රකාශනයේ මිල | | |
| බැඳුම් ගාස්තු | | |
| වෙනත් වියදම් | | |
| එකතුව | | |

| (ආ) ප්‍රකාශනය අපසාරණය කරනු ලබන දිනට වටිනාකම | රු. | ශත |
|---|---|---|
| ප්‍රකාශනයේ වටිනාකම | | |
| සියයට ගණන | | |
| බැඳුම් ගාස්තු | | |
| දඩ | | |
| වෙනත් අයකිරීම් | | |
| එකතුව | | |

............................ ............................

පුස්තකාල තොරතුරු සහකාරගේ අත්සනඃ දිනයඃ

5. ප්‍රකාශනය ලබා ගත් අයගේ නම:

ස්ථිර ලිපිනය:

ශිෂ්‍ය අංකය:

සේවා අංකය:

6. නැති වූ ප්‍රකාශනය සඳහා අයවිය යුතු වටිනාකම වශයෙන් රුපියල් .......................... ශත .......................... ක් ගෙවීමට/පිටපතක් සැපයීමට පාඨකයා එකඟ විය.

................................................... ...................................................
පුස්තකාල තොරතුරු සහකාරගේ අත්සන පාඨකයාගේ අත්සන

................................................... ...................................................
දිනය දිනය

7. ඉහත විස්තර දැක්වෙන ප්‍රකාශනයෙ හි සම්පූර්ණ වටිනාකම/පිටපතක් හා බැඳුම් ගාස්තු/කාර්යාල ගාස්තු/වෙනත් අයකිරීම් වශයෙන් රුපියල් .......................... ශත .......................... භාර ගතිමි.

කුවිතාන්සි/රිසිට්පත් අංකය: ..........................

...................................... ..........................
පුස්තකාල තොරතුරු සහකාරගේ අත්සන දිනය

...................................... ..........................
සහකාර/ජ්‍යෝෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිගේ අත්සන දිනය
(ප්‍රතිග්‍රහණ අංශය)

8. මෙහි සඳහන් ප්‍රකාශනය පුස්තකාල සම්භාරයෙන් ඉවත් කිරීම/ප්‍රකාශනයෙහි ප්‍රවේශාංකය අවලංගු කිරීම/අලුතින් පිටපතක් ලබා ගැනීම අනුමත කරමි.

................................................... ...................................................
පුස්තකාලයාධිකාරී දිනය

9. මෙහි සඳහන් තොරතුරු ඇතුළත් ප්‍රකාශනය/ප්‍රවේශාංකය ප්‍රවේශ ලේඛනයෙන් ඉවත් කරන ලදී.

.......................... ..........................
පුස්තකාල තොරතුරු සහකාරගේ අත්සන දිනය

.......................... ..........................
සහකාර/ජ්‍යෝෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිගේ අත්සන දිනය
(ප්‍රතිග්‍රහණ අංශය)

10. අපසාරණයට භාජනය කරන ලද ඉහත තොරතුරු සඳහන් ප්‍රකාශනය/ප්‍රවේශාංකයට අදාළව සූචි කාඩ්පත් සංශෝධනය කරන ලදී.

පරිගණක සූචිය : ..........................
පත්‍රිකා සූචිය : ..........................

.......................... ..........................
පුස්තකාල තොරතුරු සහකාරගේ අත්සන දිනය

.......................... ..........................
සහකාර/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිගේ අත්සන දිනය
(තාක්ෂණික සේවා අංශය)

සැ. යු.

- මෙම ආකෘති පත්‍රයේ අංක 03 යටතේ ඇති (අ) කොටස සහ අංක 04 යන කොටස් සම්පූර්ණ කළ යුත්තේ පාඨකයෙකුගෙන් මුදල් අයකරගැනීමකට අදාළව තොරතුරු දැක්වීමක දී පමණි.

පුස්තකාලය-කැලණිය විශ්වවිද්‍යාලය ආකෘති පත්‍ර අංකය:

<u>පරිත්‍යාග ප්‍රතිග්‍රහණය කර ගැනීමට අදාළ ආකෘති පත්‍රය</u>

**1. පරිත්‍යාගය පිළිබඳ විස්තර**

පරිත්‍යාගශීලියාගේ නම:

ලිපිනය:

පරිත්‍යාගය තුළ අන්තර්ගත මූලාශ්‍ර වර්ග:

| මූලාශ්‍ර වර්ගය | ප්‍රමාණය |
|---|---|
| පොත් | |
| වාර සඟරා | |
| ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍ය | |

පරිත්‍යාගය ලැබුණු දිනය:

**2. පරිත්‍යාගය භාරගත් /නොගත් බවට ප්‍රකාශ:**

පුස්තකාලයට පරිත්‍යාග ප්‍රතිග්‍රහණය කර ගැනීමේ නිර්ණායකවලට යටත්ව මෙම පරිත්‍යාගයෙහි වන සම්පූර්ණ මූලාශ්‍ර එකතුවම භාර ගැනීම නිර්දේශ කරමි/නොකරමි.

........................................................ ........................................

සහකාර/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරීගේ අත්සන දිනය

**4. පරිත්‍යාගයෙහි ඇති සම්පූර්ණ එකතුවම භාර නොගත්තේ නම් එයට හේතු:**

**5. පරිත්‍යාගය භාර දුන් බවට ප්‍රකාශය:**

ඉහත නම සහ ලිපිනය දරණ මා විසින් කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලයට පරිත්‍යාග ප්‍රතිග්‍රහණය කිරීමට අදාළ නිර්ණායකවලට යටත්ව මෙම එකතුව පරිත්‍යාගයක් ලෙස භාර දුන් බවට සහතික කරමි. තවද, මෙම එකතුව තුළ ඇති මූලාශ්‍රවලින් පුස්තකාලයට අවශ්‍ය මූලාශ්‍ර පමණක් ප්‍රතිග්‍රහණය කර ගෙන අනවශ්‍ය යැයි තීරණය වන මූලාශ්‍ර වෙනත් පුස්තකකාලයකට/අධ්‍යයන ආයතනයකට/පාඨකයන්ට කිසිඳු මුදල් අය කර ගැනීමකින් තොරව ලබා දීමටත්, එසේ වෙනත් පාඨකයෙකු හෝ ආයතනයක් විසින් බාර නොගන්නා ප්‍රකාශන විනාශ කර දැමීමටත් අවසර ලබා දෙන බව මෙයින් සහතික කර සිටිමි.

.................................. ....................................

පරිත්‍යාගශීලියාගේ අත්සන දිනය